# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2249/15 - 2021 ඔක්තෝබර් මස 13 වැනි බදාදා - 2021.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/92 (iii)

**1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත**

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 34 වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 64 වන වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

පරිසර අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත පරිදි වූ, 1993 නොවැම්බර් මස 26 වන දින අංක 794/23 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1993 අංක 1 දරන පතල් කැනීම් (බලපත්‍ර දීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. :-

(1) එහි 3 වන නියෝගයේ (6) වන ඡේදයේ "එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා" යන වචන වෙනුවට "පවත්නා ඛනිජ සංචිත පදනම් කරගෙන අවමය වසර එකක කාලසීමාවක් සහ උපරිමය වසර තුනක කාලසීමාවක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි 5 වන නියෝගයේ 3(ආ) ඡේදයේ ''වසර එකකට නොවැඩි කාලසීමාවකට'' යන වචන වෙනුවට ''පවත්නා ඛනිජ සංචිත පදනම් කරගෙන අවම වසර එකක කාලසීමාවක් සහ උපරිමය වසර තුනක කාලසීමාවක් සඳහා'' යන වචන ආදේශ කිරීමෙන්.

10-404